# මේ සිදුවීම් පිටුපස පැහැදිලිවම ආණ්ඩුව ඉන්නවා

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා



**ඇයි මේ ජවිපෙ දෙකඩ වීමක් ගැන සංවාදයක් මතු වෙලා තියෙන්නේ?**

ඉස්සෙල්ලාම කිව්වොත් ජවිපෙ දෙකඩ වෙලත් නෑ. කිසි කෙනෙකුට ජවිපෙ දෙකඩ කරන්නත් බෑ. අපේ රටේ ජනතා විමුක්ති පෙරමුණ දෙකඩ කරන්න ඉතිහාසය පුරාම උත්සාහ දරපු අය සිටියා. 1965 අපේ පක්ෂය පිහිටුවූ දවසේ සිටම අපේ පක්ෂය කඩන්න බිඳින්න විවිධ උත්සාහයන් තිබුණා. 1971 මර්දනයෙන් පසු පක්ෂය දෙකට කඩන්න උත්සාහ කළා. ඒක කරගන්න බැරිවුණා. ඊට පස්සේ 1978 නැවත දේශපාලනය පටන් ගත්තට පස්සේ උත්සාහයක් තිබුණා. ඒක බැරිවුණා. නැවත 1983 පක්ෂය තහනම් කළාට පස්සේ එහෙම උත්සාහයක් තිබුණා. ඒක බැරිවුණා. අපි දන්නවා දැනුත් මේ රටේ හතුරන්ට සහ පක්ෂයේ හතුරන්ට අපේ පක්ෂය දෙකඩ කරන්න වුවමනා වෙලා තියෙනවා. නමුත් පක්ෂය දෙකඩ කරන්න බැරිවෙලා තියෙනවා. ඔවුන්ට කවදාවත් දෙකඩ කරන්න වෙන්නෙත් නෑ මේ පක්ෂය.

පක්ෂය තුළ වැරදි කරපු, අඩුපාඩුකම් කරපු එක්කෙනෙක් දෙන්නෙක් පක්ෂයෙන් එළියට ගියාට ඒක අපි දෙකඩ වීමක් හැටියට සලකන්නේ නැහැ. අපි සලකන්නේ මේක පක්ෂයේ වඩාත් ක්‍රමවත් වීමක් සහ පක්ෂය වඩාත් පිරිසිදු වීමක් හැටියටයි.

**විමල් වීරවංශ මන්ත්‍රීවරයා ජවිපෙ ප්‍රධාන භූමිකාවක් නොවෙයි ද? ඔහු ඉවත්වීම ප්‍රශ්නයක් නොවෙයි ද?**

විද්‍යාවෙ කියමනක් තියෙනවා, -මතුපිටින් පෙනෙන දෙය සත්‍යය නම් විද්‍යාවක් අවශ්‍ය නොවනු ඇත." කියලා. මේ නිසා මතුපිටින් ගත්තට පස්සේ පිටතට පෙනෙන්න පුළුවන් විමල් වීරවංශ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රබල වැඩ කොටසක් කළා කියලා. ඇත්තටම ගත්තොත් අපි ඒක ප්‍රතික්ෂේප කරන්නෙ නෑ. ඔහු පක්ෂයේ වැඩකරපු කාලය තුළ කිසියම් දායකත්වයක්, ප්‍රබල භූමිකාවක් රඟපෑවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ විමල් වීරවංශ කියන්නේ මොන ප්‍රබලකම් තිබුණත් අපේ පක්ෂයේ එක්කෙනෙක් විතරයි. අපි පක්ෂයක්, දැවැන්ත සංවිධානයක්. ඒ නිසා කිසියම් ප්‍රශ්නයක්, කිසියම් අඩුපාඩුකමක් නිසා විමල් වීරවංශ වගේ කෙනෙක් නතර වුණත්, නැත්නම් පක්ෂයට එයාව අයින් කරන්න සිද්ධ වුණත් ඒකෙන් පක්ෂයට බරපතළ හානියක් වෙන්නෙ නෑ කියලා අපිට හොඳ විශ්වාසයක් තියෙනවා. මොකද අපි සංවිධානයක් ලෙස වැඩකරන පක්ෂයක් නිසා. සමහර අය හිතාගෙන ඉන්න විදියට, විමල් වීරවංශ යනු, ජනතා විමුක්ති පෙරමුණ නෙවෙයි. අපේ පක්ෂයේ කවදාවත්, අපි තනි පුද්ගලයෝ විදිහට පක්ෂය හදලා නෑ.

මේ පක්ෂය බරපතළ ලෙස අකර්මන්‍ය වෙනවා නම් එසේ විය හැකිව තිබුණේ 1989 නොවැම්බර් මාසේ 13 වැනිදා රෝහණ සහෝදරයා මරා දාපු දවසේ. දේශපාලන මණ්ඩලයේ සෝමවංශ සහෝදරයා හැර සියලු දෙනාම මරා දාපු දවසේ. ඒත් එවැනි විනාශයකින් පස්සෙත් මේ පක්ෂය නතර කරන්න බැරිවුණා. මොකද මේක සමාජයීය අවශ්‍යතාවක් මත නිර්මාණය වෙච්ච දේශපාලන ව්‍යාපාරයක්. දැවැන්ත සංවිධානයක්. ඒ නිසා පක්ෂයෙන් කිසියම් කෙනෙක් දෙන්නෙක් ඉවත්වුනොත් ඒකෙන් මේ පක්ෂයේ ගමන නතර වෙන්නේ නෑ.

විමල් වීරවංශ වැඩකරන කාලෙ කිසියම් වැඩ කොටසක් කළාට, ප්‍රචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රධානියෙක් හැටියට හිටියට සමස්ත පක්ෂය රැඳී තිබෙන්නේ ඒ මත නොවෙයි. අපේ පක්ෂය දැවැන්ත සංවිධාන ශක්තියක් තියෙන පක්ෂයක්. අපිට හිතෙන විදියට විමල් වීරවංශලා වරද්දාගත් තැනත් ඕක තමයි. ඒ ගොල්ලෝ හිතුවා ඒ ගොල්ලෝ තමයි පක්ෂය කියලා. නමුත් දැන් තේරිලා තියෙනවා පක්ෂය කියන්නේ ඒ ගොල්ලො පමණක් නෙවෙයි කියන එක.

**විමල් වීරවංශ මන්ත්‍රීවරයා දැන් චෝදනා කරනවා ජනතා විමුක්ති පෙරමුණ -දවල් මිගෙල් - රෑ දනියෙල්" ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා කියලා. එක්සත් ජාතික පක්ෂය සමඟ ගනුදෙනු කරනවා කියලා?**

ජනතා විමුක්ති පෙරමුණට එක්සත් ජාතික පක්ෂයත් එක්ක කිසිම දවසක ගනුදෙනුවක් තිබුණොත් නැහැ; ගනුදෙනුවක් ඇත්තෙත් නැහැ; ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ කිසිම සාමාජිකයෙක්, නායකයෙක් එක්සත් ජාතික පක්ෂයත් එක්ක නෑ. ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් ගත්තොත් මං ඉතා වගකීමෙන් කියනවා ජනතා විමුක්ති පෙරමුණට දවල් මිගෙල් - රෑ දනියෙල් ප්‍රතිපත්තියක් නැහැ.

එහෙත් විමල්ට ඉදිරිපත් වෙච්ච චෝදනා අතර බරපතළ චෝදනා තමයි, පක්ෂයේ තොරතුරු පිටට දීම; පක්ෂය තුළ කණ්ඩායමක් හැදීමට දැනුවත්ව කටයුතු කිරීම කියන චෝදනා. ඒක ඇතුළෙ නම් තියෙනව දවල් මිගෙල් - රෑ දනියෙල් ප්‍රතිපත්තියක්. විමල් අනුගමනය කරපු ක්‍රමය, ජනතා විමුක්ති පෙරමුණ තුළ, ඊට එරෙහි කණ්ඩායමක් හදන්න උත්සාහ කිරීමයි. ජනතා විමුක්ති පෙරමුණ විමල් විසින් අවසාන කාලයෙදි මහින්ද රාජපක්ෂට ගැටගහන්න උත්සාහ කළා. එනිසා දවල් මිගෙල් - රෑ දනියෙල් ප්‍රතිපත්තියක් අනුගමනය කරල තියෙන්නේ අපි නෙවෙයි; විමල් වීරවංශ!

ඒ නිසා තමයි එයාට එක මොහොතක දී ඒ ප්‍රතිපත්තිය අතඇරලා එක පැත්තකට යන්න සිද්ධ වුණේ. ජනතා විමුක්ති පෙරමුණ වගකීමෙන් කියනවා, එක්සත් ජාතික පක්ෂය එක්ක හෝ අපේ රටේ හතුරන් එක්ක ගනුදෙනු කරලත් නෑ. කරන්නෙත් නෑ. නමුත් මෙතැන බරපතළ කුමන්ත්‍රණයක් තියෙනවා. විමල් වීරවංශ දැනුවත්ව ජනතා විමුක්ති පෙරමුණට, ජනතා විමුක්ති පෙරමුණේ සමහර නායකයන්ට මෙවැනි අභූත, අසත්‍ය චෝදනා ගෙන එමින් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ කරමින්, ජනාධිපතිවරයාගේ හෝ වෙනත් අයගේ ඕනෑ එපාකම් ඉෂ්ටකරමින් ඉන්නවා.

මේක අපට අලුත් දෙයකුත් නෙවෙයි. මීට කලිනුත් ජනතා විමුක්ති පෙරමුණේ හතුරො හැම තිස්සෙම උත්සාහ කළා පක්ෂය එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ කරන්න. අපට මතකයි 1977 සිට 83-84 දක්වා කාලය තුළ ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂයේ වලිගයක් කියලා අවලාද නගපු අයත් හිටියා. නමුත් පස්සෙ ලෝකයට තේරුණා ජනතා විමුක්ති පෙරමුණ මොනවගේ පක්ෂයක් ද කියලා. දැනුත් විමල් වීරවංශලා ප්‍රතිගාමීන්ගේ වුවමනා ඉටුකරනවා. මේ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධයි හරි, බටහිර ප්‍රතිගාමී බලවේග සමඟ ඉන්නව කියල හරි ඔප්පු කරගන්න වුවමනා වෙලා තියෙන්නේ වෙන කාටවත් නොවෙයි, මේ රටේ සතුරු බලවේගවලට; ප්‍රතිගාමීන්ට. ඉතින් ඒ ප්‍රතිගාමීන්ගේ වුවමනාව තමයි විමල් වීරවංශලා දැන් ඉටු කරමින් ඉන්නේ. ජනතා විමුක්ති පෙරමුණ තමයි පක්ෂයක් ලෙස අපේ රටට එරෙහිව එන බටහිර කුමන්ත්‍රණවලට එරෙහිව සටන් වැදුනෙ. එක්සත් ජාතික පක්ෂය පරද්දන්න කටයුතු කළේ, එක්සත් ජාතික පක්ෂයට බලයට එන්න නැවත ඉඩකඩ නැතිවෙන්න කටයුතු කළේ.

නමුත් විමල් වීරවංශ කියන්න උත්සාහ කරනවා ඒ ඔක්කොම කළේ එයා තනියම, පක්ෂය ඊට අදාළ නෑ කියලා. ඉතින් අපට තියෙන්නේ විමල් වීරවංශ ගැන කනගාටු වෙන එක විතරයි.

**ඔය විදියෙ අර්බුද පැවතුණා නම් ඔහු පිළිබඳ ජනතා විමුක්ති පෙරමුණේ අදහස රටට ප්‍රකාශ කරන්නට විමල් වීරවංශ මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු ප්‍රකාශය දක්වා ප්‍රමාද කළේ ඇයි ?**

ඇත්තටම, මේක ටිකක් පැහැදිලි කරන්න ඕන. අපි පහුගිය කාලයක් තිස්සෙම විමල් වීරවංශගේ තිබිච්ච අඩුපාඩුකම් පිළිබඳව සාකච්ඡා කළා, අපේ පක්ෂ සංවිධානවල. ඔහුගේ අඩුපාඩුකම් පිළිබඳව විවේචන ඉදිරිපත් කරලා තිබුණා. අපේ පක්ෂයේ අපේ සංවිධාන එකතු වුනාම ඒ සංවිධාන තුළ ස්වයං විවේචන හා විවේචන කියලා ක්‍රමයක් තියෙනවා. තමතමන් තුළ මතුවෙන අඩුපාඩුකම් පිළිබඳ ස්වයංවිවේචනය කරනවා. ඒ අතරම අපි දැකපු විවේචන ඉදිරිපත් කරනවා. ඉතිං විමල් සම්බන්ධවත් ඒවගේ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැඟුණා.

විශේෂයෙන් ගත්තොත් කාලයක් තිස්සෙම විමල් පක්ෂයට අනුව වැඩ නොකරන කිසියම් නිදහස්වාදී ක්‍රමයකට වැඩකරන, පක්ෂයේ මතයට අනුව වැඩ නොකරන සහ පක්ෂය විසින් නිර්මාණය කරන ලද ආයතන හා සම්පත් තමන්ගේ වෙනත් දේශපාලන අරමුණක් වෙනුවෙන් පාවිච්චි කරන්න උත්සාහ දරනවා කියන තොරතුරු සහ දැනුම අපට ලැබිලා තිබුණා. එනිසා ඒවා සාකච්ඡා කරමින් හිටියේ. එහෙම සාකච්ඡා කරමින් ඉඳල තමයි අපි  පසුගිය පෙබරවාරි මාසෙ 26 වෙනිදා පක්ෂයේ මධ්‍යම

කාරක සභාවෙදි මේ පිළිබඳ චෝදනා විමල්ට ඉතා පැහැදිලිව ඉදිරිපත් කළේ. මේ චෝදනා ඉදිරිපත් කළේ සෝමවංශ අමරසිංහ සහෝදරයායි. ඉතිං ඊට පස්සේ දේශපාලන මණ්ඩලයේ වෙනත් සාමාජිකයනුත් විවේචන ඉදිරිපත් කළා. ඊට පස්සේ ඒ චෝදනා සම්බන්ධයෙන් අපි දීර්ඝව සාකච්ඡා කළා. ඊට පස්සෙ දින 2ක් සාකච්ඡා කළා. විමල් සමහර ඒවට උත්තර දුන්නා. සමහර ඒවට උත්තර දෙන්න එයාට බැරිවුණා. ඉතින් විමල් තමන්ට ඉදිරිපත් වෙච්ච චෝදනාවලට සම්පූර්ණයෙන්ම නිවැරැදියි කියලා පෙනෙන්න තිබුණෙ නැහැ. ඒ නිසා ඒ චෝදනා සාකච්ඡා වෙමින් තිබුණේ. අපි එයාට කියලා තිබුණා ඒ දේවල්වලට උත්තර දෙන්න කියලා. ඊට පස්සෙ විමල් සංවිධානවලට එන්නෙ නැතිව මඟ ඇරියා.

මධ්‍යම කාරක සභා රැස්වීමකට ආවෙ නෑ. දේශපාලන මණ්ඩලේ රැස්වීම්වලට ආවෙ නෑ. පක්ෂ සංවිධානවලට එන්නෙම නැතිවුණ නිසා පක්ෂයේ දේශපාලන මණ්ඩලය ගත්ත තීරණයක් මත මමයි, අපේ පක්ෂයේ දේශපාලන මණ්ඩලයෙ ලාල් කාන්ත සහෝදරයායි, චන්ද්‍රසේන විජේසිංහ සහෝදරයායි අපි තුන් දෙනාම විමල් ව පැලවත්තෙ අපේ කාර්යාලයට ගෙන්නල විමල්ගෙන් ප්‍රශ්න කළා, ඇයි ඔයා සංවිධානවලට එන්නෙ නැත්තෙ කියලා. එතකොට විමල් කිව්වා එයාට සංවිධානවලට එන්න බෑ, සංවිධානයට මූණ දෙන්න බැරි නිසා. අපි කිව්වා ඔයා සංවිධාන සැසිවලට ඇවිල්ලා මේ ප්‍රශ්න විසඳගන්න කියලා.

එහෙම තමයි කළේ. නමුත් එයා සංවිධාන සැසිවාරවලට ආවේ නැහැ. ඊට පස්සෙ අපි තීන්දුකළා සංවිධානවලට එන්නෙ නැත්නම් මේ ප්‍රශ්නෙ විසඳනකල් පෞද්ගලික සම්බන්ධයක් හෝ තියෙන්න ඕන කියලා. පක්ෂය මට ඒක පැවරුවා. මම විමල් එක්ක බොහෝම පැහැදිලිව සම්බන්ධකම් පවත්වාගෙන ගියා. මම ඔය කාලය තුළ විමල්ට පණිවිඩ ගණනාවක් කියලා තියෙනවා. විමල්, මට මොකවත් කියලා නැහැ. මගෙන් මොනවත් අහල නෑ. විශේෂයෙන්ම මං අවධාරණය කරල කියන්න ඕන, 21 වෙනිදා පැවැත්වුණු මධ්‍යම කමිටුවක දී එයා නෙරපුවා කියන කතන්දරය ගැන. ඒක අමූලික බොරුවක්. අපේ පක්ෂයෙන් විමල් ගැන ඒ වගේ තීන්දුවක් අරන් නැහැ. විමල්ගෙ ටෙලිෆෝන් එක චෙක් කරල බැලුවොත් 21 වෙනිදාම හවස 5.00ට විතර මං විමල්ට කෝල් එකක් අරන් තියෙනවා. අප්‍රේල් සමරුව එනවා, අප්‍රේල් සමරුවට අපිට අවශ්‍ය වෙලා තිබුණා කලා සංගමයෙන් සමරු ගීත ටිකක් හදාගන්න. මොකද, කලා සංගමය තියෙන්නේ විමල්ගේ වගකීමෙ. ඒ නිසා විමල් මගින් තමයි කලා සංගමයට පණිවිඩය කිව්වෙ. ඊට පස්සෙ මම විදේශගත වෙන්න කලින් ආපහු සැරයක් අප්‍රේල් මාසෙ දෙවෙනිදා විමල්ට කතා කරලා පණිවිඩ කීපයක් කිව්වා.

අපි නැඟෙනහිර පළාතේ මැතිවරණයට යොදාගත්තු රැස්වීම් දෙකක් තිබුණා, අප්‍රේල් 20 අම්පාර සහ අප්‍රේල් 22 කන්තලේ. මේ රැස්වීම් දෙකට එන්න කියලා කිව්වා. මේ අතරම අප්‍රේල් සමරුව තියෙනවා. විදේශගත වන නිසා අප්‍රේල් සමරුවට මටත් සම්බන්ධ වෙන්න වෙන්නෙ නෑ. ඒ නිසා අප්‍රේල් සමරුවේ වේදිකාවට එන්න කියලා මම කිව්වා. පණිවිඩ කියන්න අපි සාමාන්‍යයෙන් යොදාගන්න ක්‍රමය මම ඒ විදියටම අනුගමනය කළා.

නමුත්, විමල් වීරවංශ ඒ ඔක්කොම තියෙද්දි ඒවා පැත්තකට දාල තමන්ගේ වෙනම සැලැස්මකට කටයුතු කරලා තියෙනවා. ඒ සැලැස්ම පැහැදිලියි. ඒක තමයි, පක්ෂය විසින් නිර්මාණය කරපු ආයතන, සම්පත් සහ එයා විසින් බොරු කියලා දිනාගත්ත පුද්ගලයො ටිකකුත් අරගෙන පක්ෂයෙන් ගැලවිලා ගිහින් වෙනම කටයුතු කිරීම.

ඉතිං එයා සම්බන්ධව පරීක්ෂණ පැවැත්වෙමින් තියෙද්දි, මේ පරීක්ෂණ එයාට අවාසියි කියලා දැනෙද්දි තමයි එයා තීන්දුවක් අරගෙන පාර්ලිමේන්තුවෙදි ප්‍රකාශයක් කළේ. අර ගමේ කතාවක් තියෙනවා, 'හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා' කියලා. ඒ වගේ මෙයා ප්‍රශ්නය සාකච්ඡා කරලා තමන්ට ඒකට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් මතුවෙන කොට ඒක නොමඟ යවන්න තමයි පාර්ලිමේන්තුවෙ ප්‍රකාශය කරන්නේ.

එතැනත් බරපතළ වරදක් තියෙනවා. දේශපාලනය දන්න ඕන කෙනෙක් දන්නව විමල්ට කිසියම් ගැටලුවක් තිබුණා නම්, තමන්ව පක්ෂයෙන් නෙරපුව කියලා සැකයක් තිබුණ නම්, විමල් කතා කළ යුතුව තිබුණේ පක්ෂයට. සෝමවංශ අමරසිංහ සහෝදරයාට කතා කරන්න තිබුණා. නැතිනම් මට කතා කරන්න තිබුණා. එහෙම නම් අපි මධ්‍යම කමිටුව කැඳවනවා. දේශපාලන මණ්ඩලය කැඳවනවා. කැඳවලා එයාගෙ ප්‍රශ්නය සාකච්ඡා කරනවා. අපිට කතා නොකර තමයි වි.ජ.මු. ලොකු බණ්ඩාරට මේ නඩුව කියන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ අභ්‍යන්තර ප්‍රශ්නයක්, විනය ප්‍රශ්නයක්, සංවිධාන මට්ටමේ

ප්‍රශ්නයක් බේරන්න පාර්ලිමේන්තුවෙ කතානායකට බෑ. ලොකුබණ්ඩාර මහත්තය ළඟ ඇඬුවට හරියන්නේ නෑ. අඬනකොට කම්පා වෙන තරුණ මන්ත්‍රීවරු කීපදෙනෙක් එකතු කරගෙන කුමන්ත්‍රණකාරී විදිහට තමයි දේශහිතෛෂී කාර්යාලයට ගිහිල්ල එතැන කෑම බීම ලෑස්ති කරල තියල, එතැන දි ජනතා විමුක්ති පෙරමුණේ නැති පුද්ගලයො සම්බන්ධ කරගෙන දේශන තියලා පුවත්පත් සාකච්ඡා කරල එතැනදීම මන්ත්‍රී වැටුප් පෞද්ගලිකව තමන්ට ගැනීමේ ලියුම් අස්සන් කරන්න උත්සාහයක නිරත වුණේ. ඒකෙන් පැහැදිලියි විමල්ලා සැලැස්මක ඉඳල තියෙනවා. සැලැස්මෙ එක ජවනිකාවක් තමයි පාර්ලිමේන්තුවේ අඬමින් කරපු කතාව.

**පක්ෂයෙ වෙනම කණ්ඩායමක් වශයෙන් මාධ්‍ය සාකච්ඡාවකුත් පැවැත් වුණා ?**



අපේ පක්ෂයේ විමල්ගේ පිරිසයි, සෝමවංශගෙ පිරිසයි, ටිල්වින්ගෙ පිරිසයි කියලා පිරිස් නෑ. අපේ පක්ෂයේ ඉන්නෙ ජනතා විමුක්ති පෙරමුණේ අය. නමුත් විමල් පසුගිය කාලෙ බොහොම කුමන්ත්‍රණකාරී විදිහට (ඒක අපි වගකීමෙන් කියනවා.) සමහර මන්ත්‍රීවරුන්ට කතා කරලා, තමන්ට අසාධාරණයක් වුණා, කියමින් ඔවුන්ගේ අනුකම්පාව දිනාගැනීම සඳහා ක්‍රියාවලියක නිරත වෙලා තියෙනවා. එහෙම කරමින් ඉඳල තමයි 08 වෙනිදා ඔය පාර්ලිමේන්තුවෙ කතාව කරන්නේ.

පාර්ලිමේන්තුවෙ අඬා වැටෙනකොට ඒ පිළිබඳ දුක හිතිච්ච මන්ත්‍රීවරු පිරිසක් තමයි එයා ගාවට ගිහිල්ල මොකද කියල අහන්නේ. තමන්ව පක්ෂයෙන් නෙරපුවා කියලා බොරු කිව්වට පස්සෙ ඒ පිළිබඳව කම්පාවට පත්වෙච්ච මන්ත්‍රීවරු පිරිසක් තමයි ඒ ප්‍රශ්නය විසඳාගැනීම සඳහා වන සාකච්ඡාවකට යන්නේ. විමල් ඒක පාවිච්චි කරලා තමයි ඒ ගොල්ලන්ව අරගෙන ගිහිල්ල පුවත්පත් සාකච්ඡාවක් තියන්නේ. ඒ අය ඒකට මුහුණු ටික පෙන්නල අද ලොකු අර්බුදයකට පත්වෙලා ඉන්නෙ. අපේ පක්ෂයේ හිටපු, දේශපාලන අනාගතයක් තියෙන තරුණ මන්ත්‍රීවරුන් පිරිසකගේ දේශපාලන අනාගතයත් විමල් තමන්ගේ කුමන්ත්‍රණවලින් විනාශ කරලා තියෙනවා.

අද ඒ බොහෝ මන්ත්‍රීවරු පක්ෂයට,  ප්‍රදේශයට, ජනතාවට මුහුණ දීගන්න බැරිව, තමන්ගේ පවුලට මුහුණ දීගන්න බැරිව හරි අමාරුවෙන් ඉන්නවා. ඉතින් අපි ඒ අයට කතා කරල කියන්නේ, -ප්‍රශ්නයක් නෑ. පක්ෂයට ඇවිත් වැඩ කරන්න." කියලා. ඒ අනුව සුජාතා අලහකෝන් සහෝදරිය ආවා. එයා තේරුම් ගත්තා වෙච්ච වැරැද්ද. පුවත්පත් සාකච්ඡාවක් කළා. ඉතිං අපි විශ්වාස කරනවා ඉදිරියෙදි අනිත් අයත් එයි කියලා.

විමල් සමඟ ඔය කුමන්ත්‍රණයේ තව එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. ඒ අය විතරක් ඉතුරු වෙයි.

**මේ ක්‍රියාවලියත් සමඟම ජවිපෙ මන්ත්‍රීවරු පිරිසකගේ වාහන මංකොල්ලකෑමක් ගැනත් වාර්තා වුණා ?**

මංකොල්ල කන්නේ අනුන්ගේ වාහන නේ. අපේ පක්ෂයේ වාහන ගෙන එන එක ඒ විදියට අර්ථ ගන්වන එක වැරදියි. මේ වාහන අපේ පක්ෂයේ වාහන. පහුගිය කාලෙ අපි මන්ත්‍රීවරුන්ගේ

පර්මිට්වලට වාහන තිස් ගණනක් ගත්තා. ඒ වාහන ඔක්කෝම ගත්තෙ පක්ෂයේ සල්ලි දීලා. එක මන්ත්‍රීවරයෙක්වත් සත 5ක් දීලා නෑ ඔය වාහන ගන්න. ඒ වාහන අයිති පක්ෂයට. ඒ වාහන භාරදෙන දවසේ මන්ත්‍රීවරු ඔක්කොම එකතු කරලා මමයි, අනුර සහෝදරයයි එකතු වෙලා සාකච්ඡාවක් කළා. අපි ඒ ගොල්ලන්ට කිව්වා, -අපි වාහන ගත්තෙ පක්ෂයෙ සල්ලිවලින්. මේ වාහන ගත්තෙ ඕගොල්ලන්ට මහජන සේවා වැඩ කරන්න පහසුව සඳහා, මේ වාහන අයිති පක්ෂයට" කියලා.

ඉතිං, එහෙම තියෙද්දී තමයි එදා ඔය ප්‍රශ්නෙදි පක්ෂයේ වාහන ටික දාලා ඒගොල්ලො තමන්ගෙ වෙන වාහනවලින් පුවත්පත් සාකච්ඡාවට යන්නේ. එහෙමයි පක්ෂයේ වාහන ටික ආරක්ෂාවක් නැතිව පාර්ලිමේන්තුවෙ දාල ගිහිල්ලා තියෙන්නේ.

ඒ නිසා එතන හිටපු සහෝදරවරු කල්පනා කළා පක්ෂයේ වාහන ගේන්න ඕන කියලා. ඊට පස්සෙ තමයි ජයන්ත සහෝදරය මැදිහත් වෙලා පක්ෂයේ වාහන ටික ගෙනැල්ලා පක්ෂ මූලස්ථානයේ

මිදුලේ තියන්නේ. වාහන පැහැරගන්නවා නම් පැහැර ගැනීමකට අපි කවදාවත් ජයන්ත සහෝදරයා වගේ මන්ත්‍රී කෙනෙක් යොදවනව ද? පැහැරගත්ත වාහන ගෙනැල්ල අපේ මූලස්ථානයේ ළඟ රඳවලා තියෙනවා ද? එහෙම තියන්නෙ නෑ. පොලිසියෙන් එනකොට වාහන එතැන නතර කරලා තිබුණා. මේවා පැහැරගත්ත වාහන නෙවෙයි. අපේ වාහන. නමුත් අපේ වාහන අතන දාලා ගියාට පස්සෙ ඒක හොඳ නැති නිසා පක්ෂ මූලස්ථානයට ගෙනැල්ල තිව්ව. මේ මිනිස්සු පොලිසියේ පැමිණිලි දාලා ජයන්ත විජේසේකර සහෝදරයව රිමාන්ඩ් කළා.

මේ ගොල්ලො කියන්නේ ජනතා විමුක්ති පෙරමුණට දේශපාලනය තේරෙන්නෙ නෑ. ඒ ගොල්ලො දේශහිතෙෂීන්, දේශප්‍රේමීන් , රට වෙනුවෙන් කැක්කුමක් තියෙනවා. අධිරාජ්‍ය විරෝධී අරගලය කරන්නෙ ඒ ගොල්ලො කියලා. ඉතිං අධිරාජ්‍ය විරෝධී අරගලයේ ඉන්නවා කියන අය නැඟෙනහිර පළාතෙ, ත්‍රිකුණාමලයේ ඊළාම් කොඩිය උස්සපු වෙලාවෙ ඊළාම් කොඩිය බිම දාලා තනියම ගිහිල්ලා සිංහ කොඩිය උස්සපු ජයන්ත විජේසේකරව, නැඟෙනහිර පළාතෙ කොටි ත්‍රස්තවාදීන්ගෙ බරපතළ තර්ජනයකට මුහුණ දීලා ඉන්න ජයන්ත විජේසේකර සහෝදරයව රිමාන්ඩ් කරවනවා.

රිමාන්ඩ් එක ඇතුළෙ ජීවිත ආරක්ෂාවක් නෑ. රිමාන්ඩ් කරනව නම් ඒ ගොල්ලන්ගෙ පටු අරමුණ මොකක්ද කියලා අපට හිතාගන්න පුළුවන්. රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ ඒකීයභාවය වෙනුවෙන්, අධිරාජ්‍ය විරෝධීභාවය වෙනුවෙන් ප්‍රායෝගිකව වැඩ කරපු, විමල්ල වගේ කෑගහල විතරක් නතර නොවී, තමන්ගේ ජීවිතය පරදුවට තියලා සිංහ කොඩිය උස්සපු ජයන්ත විජේසේකරව වාහන පැහැරගත්ත කියල පැමිණිල්ලක් දාල රිමාන්ඩ් කරවන්න පුළුවන් නම්, (රිමාන්ඩ් කෙරෙව්වෙත් ආණ්ඩුව ලවා බරපතළ විදිහට බලපෑම් කරවලා) ඊට පස්සෙ ඇප දෙන්නෙ නැතිව සති දෙකක් රිමාන්ඩ් කරන්න උත්සාහ කළා නම්, එයින්ම පේනව ඒ ගොල්ලන්ගෙ ප්‍රතිගාමී අරමුණ මොකක් ද කියලා. පිටින් කියන දේ නොවෙයි අභ්‍යන්තරයේ තියෙන්නේ කියන එක පැහැදිලියි.

**සමහර මාධ්‍ය වාර්තා කර තිබුණා ඇතැම් මන්ත්‍රීවරුන්ගේ නිවාසවලට ප්‍රහාර එල්ල වුණා කියලා?**

මේව නම් අපි හිතන්නේ හදාගත්ත බොරු. තමන් කරපු වැරැද්ද රටට හෙළිවෙමින් යද්දි මුහුණ දීගන්න බැරිව ඉද්දිදි තමන්ට අනුකම්පාව දිනාගැනීම සඳහා පහර දුන්නා, වාහන පැහැරගෙන ගියා වගේ කතන්දර නිර්මාණය කරමින් ඉන්නවා. අපිට නම් කිසිකෙනකුට පහර දෙන්න ඕන කමක් නැහැ. මොකද දැන් ඒ අය දේශපාලන වශයෙන් මියැදෙමින් ඉන්න, මළ කුණු බවට පත්වෙන මිනිස්සු , ඒ මිනිස්සුන්ට පහර දීලා නිකං අපේ ඇඟේ ජරාව ගා ගන්න අපට කිසි වුවමනාවක් නෑ. ඒ නිසා මේවත් අර කුමන්ත්‍රණයේ ප්‍රතිඵල කියලයි අපි හිතන්නේ.

කුමන්ත්‍රණය කරලා කණ්ඩායමක් කඩාගෙන එළියට ගෙනිච්ච අයව තියාගන්න ඕන. ඒකට ප්‍රවෘත්ති හදාගන්න ඕන. ඉතිං, ඒ සඳහා විටින්විට විවිධ ප්‍රවෘත්ති නිර්මාණය කරන්න පුළුවන්. ඒවට නම් අපේ රටේ ජනතාව රැවටෙන්න ඕන නැහැ. අපට කියන්න තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළෙ හිඳිමින් පක්ෂය අවස්ථාවාදයට ඇදගෙන යන්න, පක්ෂය මහින්ද රාජපක්ෂ ගාවට ඇදගෙන යන්න කුමන්ත්‍රණය කළා. ඒ කුමන්ත්‍රණය අසාර්ථක වීමත් එක්ක තමයි කීප දෙනෙක් එක්ක එළියට ගියේ.

නමුත් අවසානයේ දැන් ඒ අයට තේරිලා තියෙනවා, අපේ පක්ෂය කඩන්න තියා හොල්ලන්නවත් බෑ කියලා. එදා විමල්ලාගේ උත්සාහය අසාර්ථක වුණා. විමල්ගෙ කඳුළුවලට දුක හිතිලා ගිය කීප දෙනා ඒ කඳුලු කිඹුල් කඳුළු බව වටහා ගෙන හෙට අනිද්දා වෙනකොට පක්ෂයට එයි. ඒ අය අපි භාරගන්න ලෑස්තියි. නමුත්, විමල් සම්බන්ධයෙන් බරපතළ ගැටලු කිහිපයක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් පක්ෂය තීරණයක් ගත යුතුව තියෙනවා. තාම තීන්දු අරගෙන නැහැ. ඒ නිසා විමල්ට අවස්ථාවක් තියෙනවා ඕන වෙලාවක පක්ෂයට, සංවිධානය ඉස්සරහට ඇවිල්ලා තමන් කරපු දේවල් පිළිබඳව තමන්ට විරුද්ධව තියෙන චෝදනාවන්ට පිළිතුරු දීලා පක්ෂයට තීරණයක් ගැනීම සඳහා අවස්ථාව ලබාදෙන්න. එතකොට පක්ෂය ඊට අදාළ පියවර ගනීවි. තමන්ගේ ආත්ම ගෞරවය කෙළෙසා ගත්ත කෙනකු හැටියට යම් හෝ ගෞරවයක් එයාට ඉතිරි කරගන්න හැකි වෙන්නෙ එතකොටයි.

**ආණ්ඩුව සහ ආණ්ඩුවේ ඇමැතිවරු ජනතා විමුක්ති පෙරමුණ සමඟි කරවන්න ඉදිරිපත් වෙන්න කැමැත්තෙන් සිටින බවත් ප්‍රකාශ වුණා?**

මහින්ද රාජපක්ෂ මහත්තයගේ ආණ්ඩුව තමයි මේ ප්‍රශ්නය පිටිපස්සෙ ඉන්න බලවේගය. ඒ ගොල්ලන්ට අවශ්‍ය වුණා ජනතා විමුක්ති පෙරමුණ තමන්ගෙ සාක්කුවෙ දාගන්න. ජනතා විමුක්ති පෙරමුණ තමන්ට දිනාගන්න. ඒත්, ජනතා විමුක්ති පෙරමුණ ඇමතිකම් කීපයකට ආණ්ඩුවට යනවා

වෙනුවට, ආණ්ඩුවට ප්‍රතිපත්ති මාලාවක්, යෝජනා 20ක් ඉදිරිපත් කළා. මහින්ද රාජපක්ෂ මහත්තයගෙ ආණ්ඩුව උත්සාහ කළා, විමල් හරහා පක්ෂය තමන්ට පහසු ලෙස හසුරුවන්න. තමුන්ට කරදරකාරී නොවන ලෙස හසුරුවන්න. විමල් හරහා පක්ෂය කරන්නෙ මොකක්ද කියලා දැනගෙන ඒකට අනුව හැසිරෙන්න විමල්ව පාවිච්චි කළා. ඒ ගොල්ලො පසුගිය කාලෙ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළෙන් පාලනය කරන්න කටයුතු කළා කියලා අපිට සැකයක් තියෙනවා. ඒක අසාර්ථක වෙද්දි තමයි ඒ ගොල්ලො මැදිහත් වෙලාම විමල්ව ගලවල ගත්තෙ. ඒගොල්ලො හිතනව විමල් පක්ෂයෙන් ගලවල ගත්තට පස්සෙ පක්ෂය දෙකඩ වෙයි, බිඳ වැටෙයි කියලා. නමුත් දැන් මහින්ද රාජපක්ෂ මහත්තයත් තේරුම් ගන්න ඕනෑකම තියෙනවා තනි මිනිහෙකුට මේ පක්ෂයට කිසිම දෙයක් කරන්න පුළුවන් කමක් නැහැ කියලා. දැනුත් මේ ක්‍රියාවලිය පිටිපස්සෙ ආණ්ඩුව ඉන්නවා.

කල්පනා කරල බලන්න. එදා ඔය පුවත්පත් සාකච්ඡාවක් තියලා, විමල් එක්ක ගිය මන්ත්‍රීවරුන්ට දුන්නෙ කාගේ ආරක්ෂාවද? ජීෘ එකෙන් ජනාධිපති ආරක්ෂාවයි දුන්නේ. සුජාතා සහෝදරිය අපිත් එක්ක කිව්වා පුවත්පත් සාකච්ඡාව වෙනකොටත් ගෙදර පොලීසියෙ තුනක් ඉන්නවා. ජීෘ එකේ තුනක් ඉන්නවා, ඒගොල්ලෝ ආරක්ෂාව දෙනවයි කියලා. වෙනත් අපේ මන්ත්‍රීවරු කාටවත් ආරක්ෂාව දීල නෑ. ඒ නිසා ජීෘ එකේ ආරක්ෂාව දීලා, ඉන්න තැන් හොයල දීලා, ආණ්ඩුව සම්බන්ධ පත්තරවල පිටු ගණන් ලිපි දාන්න ඉඩ හදා දීලා. ඒකෙන්ම පේනව නේද ආණ්ඩුව තමයි මේ පිටිපස්සෙ ඉන්නෙ කියලා.

පැහැදිලියි, විමල්ව මහින්ද රාජපක්ෂ මහත්තය හීලෑ කරගෙන තියෙන්නෙ. ඉතින් ඒ හීලෑ වෙච්ච විමල් ඒ වෙනුවෙන් යමක් කරාවි. ඒකට ආණ්ඩුව සහයෝගය දක්වාවි.

එහෙම නැතිව ජනතා විමුක්ති පෙරමුණ නම් එවැනි කුමන්ත්‍රණවලට අහු වෙන්නෙ නෑ.

**මේ සිදුවීම්වලට ඉස්සරත්, මාධ්‍යවල මීට සම්බන්ධ සංවාදයක් පැවතුණා. ඒවාත් මේ කුමන්ත්‍රණයේ කොටස් ලෙස ද ඔබ දකින්නේ?**

ඇත්තටම ඔව්. ඒ කියන්නේ පක්ෂය තුළින් විමල්ට විරුද්ධව එල්ලවන චෝදනා බරපතළයි. ඒක තේරුණාට පස්සෙ එයා උත්සාහ කළා, පක්ෂයේ සංවිධානවලට ඇවිල්ලා, ඉදිරිපත් වෙච්ච චෝදනාවලට මූණ දීලා ඒවට කරුණු දක්වනවා වෙනුවට ඒ චෝදනාවලට ලක්වීම වළක්වා ගැනීම සඳහා රට තුළ වෙන මතයක් හදන්න.

ඉතා පැහැදිලියි. අපි විමල්ට චෝදනා ඉදිරිපත් කළදාට පසුදා ආපු දිවයින පත්තරේ ප්‍රධාන ප්‍රවෘත්තියෙ  තිබුණේ ජාතික ව්‍යාපාරයේ නායකයෝ ඝාතනය කරන්න, චරිත ඝාතනය කරන්න කුමන්ත්‍රණයක් තියෙනවා, ඒකට පක්ෂයේ ඇතුළෙනුත් කට්ටිය සම්බන්ධයි කියලා. පක්ෂ වගකීම්වලින් ඉවත් කරන්න හදනවා කියලා. තමන්ගේ වැරැද්ද වහගැනීම සඳහා, තමන්ට එරෙහි ක්‍රියාමාර්ගයක් එනවා නම් වැළැක්වීම සඳහා ප්‍රවෘත්ති පළ කරන්න පටන්ගත්තා. ඊට පස්සෙ අපිට මතකයි පසුගිය දවසක 'දිනමිණ' පත්තරයෙ තිබුණා අපේ අනුර සහෝදරයාගේ නම සඳහන් කරලා, අනුර පක්ෂයේ ප්‍රබලයකු එලවන්න රවී කරුණානායකගේ ගෙදර දී බටහිර තානාපති කෙනෙක් එක්ක සාකච්ඡා කළා කියලා. අමූලික බොරු වාර්තාවක්. ඒ වාර්තාව ලියපු කෙනාගෙ නම සටහන් වෙලා නෑ. ඒක නිර්නාමිකව තිබ්බ්ච වාර්තාවක්.

අපි නඩුවක් දාල තියෙනවා ඒ බොරු ප්‍රවෘත්තියට විරුද්ධව දිනමිණ පත්තරේට. ඒ නිසා ඉතා පැහැදිලියි, විමල් මාධ්‍ය හරහා තමන් කරන වැරැද්ද, කුමන්ත්‍රණය වහ ගැනීම සඳහා මත හදමින් සිටියා. ඉතින් ඒ මත ටික හදාගෙන, හදාගෙන ඇවිල්ලා එක තැනක දි තමයි පාර්ලිමේන්තුවෙ ඔය ප්‍රකාශය කළේ. ඒක නිසා විමල් තමයි පක්ෂය ඇතුළෙ කුමන්ත්‍රණකාරීව කටයුතු කළේ.

**ඇති වූ තත්ත්වය නැගෙනහිර පළාත් සභා මැතිවරණයට යම් කිසි බලපෑමක් ඇති කරයි ද?**

ඇත්ත වශයෙන්ම නෑ. නැගෙනහිර මැතිවරණය අපි ශක්තිමත්ව කරගෙන යනවා. අපිට සැකයක් තියෙනවා ආණ්ඩුව වෙනුවෙන් නැගෙනහිර මැතිවරණයේ අපේ වැඩ කඩාකප්පල් කිරීමත් විමල්ගෙ එක අරමුණක් වෙන්න ඇති කියලා.

නැගෙනහිර පළාත් සභා මැතිවරණයේ දී ඉතාම ප්‍රබල චරිතයක් වන අපේ ජයන්ත විජේසේකර සහෝදරයා, ත්‍රිකුණාමලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බොරු චෝදනාවක් දාලා හිරගත කරන්නේ ඒක නිසා වෙන්න පුළුවන්. ඒව කරන්නේ මහින්ද රාජපක්ෂ වෙනුවෙන්.

නමුත්, ඒ ඔක්කොම තියෙද්දී අපි ශක්තිමත්ව නැගෙනහිර පළාත් මැතිවරණය කරනවා. විමල්ගෙ

ඉවත් වීමෙන් අපිට කිසිම හානියක් වෙලා නෑ. අපේ සමාජය හදපු මිථ්‍යාවක් තිබ්බා, පක්ෂයට ඡන්ද හැදෙන්නෙ, ඡන්ද කරන්නෙ විමල්ගෙ කතාව නිසා කියලා. විමල්ගෙ කතාව විසින් කරපු බලපෑමක් තිබුණා. නමුත් පක්ෂයක ඇත්ත ශක්තිය තියෙන්නේ එක පුද්ගලයකුගෙ කතාව තුළ නෙවෙයි. පක්ෂ සංවිධානය තුළ. ඒ නිසා දැන් අපේ පක්ෂයේ සියලු ශක්තිය පාවිච්චි කරලා නැඟෙනහිර පළාතෙ ඡන්දය කරනවා.

**පිල්ලෙයාන් නිරායුධ කිරීම පිළිබඳ ප්‍රකාශය මේ ගැටලුව හා බැඳී පවතිනවා. ජනතා විමුක්ති පෙරමුණ දකින්නේ පිල්ලෙයාන් කණ්ඩායම නිරායුධ කිරීම කොටි සංවිධානයට උදව්වක් ලෙස නොවේ ද?**



දේශපාලනය සරලව තේරුම් ගන්න අයට මේ පටලැවිල්ල වෙනවා. මහින්ද රාජපක්ෂගේ කණ්ණාඩි කුට්ටම තුළින් දේශපාලනය බලන අයටත් මේ අවුල වෙනවා. අපි ඉතා පැහැදිලිව කියනවා පිල්ලෙයාන්ලා, කොටින්ගෙන් කැඩිලා ඇවිල්ලා කොටින්ට එරෙහිව සටන් වදින එක හොඳයි. ඒ නිසා කොටි පරද්දන යුද්ධයේ දී කොටි පරද්දන සටනේ දී ආණ්ඩුව පිල්ලෙයාන්ව සන්නද්ධව යොදාගන්නව නම් අපි ඒකට සහමුලින්ම එකඟයි. ඒ ප්‍රශ්නයේ දී පිල්ලෙයාන්ලා සන්නද්ධව ඉන්නවා නම් අපි ඒකට හැපෙන්න යන්නේ නැහැ. ඒ ප්‍රශ්නයෙ දී පිල්ලෙයාන්ව ආරක්ෂා කරන්න, අපි ඒකටත් එකඟයි. ඒත් කොටි පැරදවීමේ අරමුණ වෙනුවෙන් යොදාගන්න ඕන පිල්ලෙයාන්ව ආණ්ඩුව විසින් ඡන්දයක් දිනන්න ආයුධ සහිතව යොදා ගන්නවා නම් ඒක වැරදියි.

මැතිවරණයක් කරනවා නම්, මැතිවරණයට ඉදිරිපත් වන සෑම කණ්ඩායමක්ම නිරායුධව කටයුතු කරන්න ඕන. එක කණ්ඩායමකට ආයුධ සන්නද්ධව ඉන්න පුළුවන් කමක් නෑ. නිරායුධව ඡන්දය කරද්දි පිල්ලෙයාන් කණ්ඩායමට ආරක්ෂාව සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා නම් අපි විශ්වාස කරනවා පිල්ලෙයාන්ට ලංකාවෙ දෙන්න පුළුවන් උපරිම ආරක්ෂාව ලබා දීල හරි නිරායුධව මැතිවරණයට ඉදිරිපත් වෙන්න දෙන්න ඕන. ආයුධ තියෙන්න ඕන සන්නද්ධ හමුදාවටයි. මේ වගේ සංවිධාන අතේ ආයුධ තිබිය යුතු නැහැ.

කෙනෙක් තර්ක කරනවා නම්, මේ වෙලාවේ පිල්ලෙයාන් කණ්ඩායම නිරායුධ කරන එක කොටින්ට වාසියි කියලා අපි කියන්නේ, කරන්න තියෙන්නේ නැඟෙනහිර පළාතේ මැතිවරණය කල්දාලා කොටි පැරදවීමේ සටන කරන්නයි.

ඒක එහෙම දකින්නෙ නැතිව අනියම් ලෙස පිල්ලෙයාන්ලට ආයුධ අතේ තියාගෙන බලහත්කාරයෙන් ඡන්ද කරලා, ඒ ඡන්ද ටික අරන් දීලා මහින්දව දිනවන්න ආසාවක් තියෙනවා නම් ඒකට අපිට කරන්න දෙයක් නෑ. ඒක අපේ දේශපාලනය නෙවෙයි.

**මේ සිදුවීම් තුළ ජනතා විමුක්ති පෙරමුණේ ඉදිරි වැඩපිළිවෙළ සකස් වෙන්නේ කුමන ආකාරයෙන් ද?**

ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මඟේ කිසි වෙනසක් නෑ. ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන වශයෙන් ඉතා පැහැදිලි තැනක ඉන්නවා. මේ රටේ බරපතල ප්‍රශ්න කිහිපයක් තියෙනවා. අපේ රටේ කේන්ද්‍රීය ප්‍රශ්නය ජාතික ගැටලුව. ඒක විසඳන්න ඕන. ඒකෙදි ත්‍රස්තවාදය පරාජයට පත්කරලා, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරලා ජනතාවට සමාන අවස්ථාවන් ලබාදීලා ඉන්න ඕන. ඒ වගේම මේ ජාතික ප්‍රශ්නය පදනම් කරගෙන අපේ රටට එල්ල වෙලා තියෙන බරපතල බටහිර කුමන්ත්‍රණ, ඒ වගේම ඉන්දියානු මැදිහත්වීම් පරාජයට පත්කරන්න ඕනකම තියෙනවා. ලංකාව, කොසෝවෝවක් බවට, සුඩානයක් බවට පත්වීම වලක්වන්න ඕන.

ඒත්, ඒක කරන්න මහින්ද රාජපක්ෂ මහත්තයට බැහැයි කියලා ඉතාම පැහැදිලියි. මහින්දත් දැන් බලය බෙදීමේ සරණ ගිහින් තියෙනවා. ඒ වගේම අපේ රට ඇතුළෙ බරපතල ආර්ථික අර්බුදයක් තියෙනවා. ඒකට උත්තර මේ ආණ්ඩුවට නෑ. වංචා දූෂණ තියෙනවා. ඒක වෙනස් කරන්න මේ ආණ්ඩුවට බැහැ. ප්‍රජාතන්ත්‍රවාදයට කණකොකා හඬන්න පටන් අරන් තියෙනවා. ඉතින් ඒ බරපතල ප්‍රශ්නත් සමඟ අපේ රට ඉදිරියට ගෙනියන්න දැන් අලුත් දේශප්‍රේමී පෙරමුණක් අවශ්‍යයි. ඒ අලුත් දේශප්‍රේමීන්ගේ හා ප්‍රගතිශීලීන්ගේ පෙරමුණ නිර්මාණය කිරීම තමයි අපි කරමින් යන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මැදිහත්වීමෙන්, ජනතා විමුක්ති පෙරමුණේ දායකත්වයෙන් නිර්මාණය වන මේ අලුත්, පුළුල් දේශප්‍රේමී සහ ප්‍රගතිශීලීන්ගේ පෙරමුණ නිර්මාණය වීම වළක්වන්න සතුරන්ට ඕනෑකම තිබුණා. ඒ නිසා විමල්ගේ මේ ක්‍රියාව තුළ ඒ අරමුණත් තියෙන්න පුළුවන්. ඇත්ත දේශප්‍රේමීන්, ඇත්ත දේශ හිතෛෂීන් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් තොරව ජනතා විමුක්ති පෙරමුණේ මැදිහත්වීමෙන් තොරව නිදහස් අරගලයක් ගැන විශ්වාස කරන්නෙ නෑ. ජනතා විමුක්ති පෙරමුණේ මැදිහත්වීමෙන් තොරව මේ රටට වෙනසක් කරන්න පුළුවන් කියලා විශ්වාස කරන්නේ නැහැ.

ඇත්ත දේශප්‍රේමීන් අපිත් එක්ක ඉන්නවා. ඇත්ත ප්‍රගතිශීලීන් අපිත් එක්ක ඉන්නවා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ ලංකාවට සැබෑ ආර්ථික සමෘද්ධිය, ජාතික නිදහස, සැබෑ සාමය දිනා ගැනීම සඳහා වන නව දේශපාලන ගමනක් ආරම්භ කරල තියෙනවා. ඒ ගමන අපි ඉතාම සවිමත්ව යනවා.

අපි ජනතාවට සහතික වෙනවා මේ රටට, මේ මාතෘ භූමියට අපි ඉතාම ඉක්මණින් ජයග්‍රහණ ගේනවා කියලා.